#MediaethicsSL #SinhalaPress #TamilPress #EnglishPress #Ika #Resa #Ada #Mawbima #Lankadeepa #Divaina #Dinamina #Anidda #Virakesari #Thinakkural #Thinakaran #TamilMirror #DailyFT #DailyMirror #TheIsland #DailyNews #CeylonToday

පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයෙන් සති කිහිපයකට පසුව පසුගිය දිනවලදී ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ කිහිපයක ප්‍රචණ්ඩ ක්‍රියා රැල්ලක් ඇතිවිණි. මෙහිදී ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට ගොදුරු වීමෙන් පුද්ගලයෙකු මිය ගිය බව විදෙස් මාධ්‍ය ඔස්සේ පළ විණි. ඉන් අනතුරුව ඇතැම් ඉංග්‍රීසි පුවත්පත්, දමිළ පුවත්පත් තුළ සහ සිංහල පුවත්පත් දෙකකද පුද්ගලයෙකු මිය ගිය පුවත පළවී තිබිණි. මෙහිදී මෙම පුවත පළ කරන්නට යෙදුණු සිංහල පුවත්පත් දෙක තුළ මූලාශ්‍ර ලෙසින් පොලිස් ආරංචි මාර්ග උපුටා දක්වා තිබිණි.

මෙම නිරීක්ෂණයත් සමගින් පාඨකයින් ලෙසින් අපට පොදුවේ සිදුවීම සම්බන්ධයෙන් නැගිය හැකි ප්‍රශ්න කිහිපයකි. ඇතැම් පුවත්පත් මගින් මෙය වාර්තා නොකළේ හානිය අවම කිරීමටද? එසේත් නැතිනම් නොනිල වාරණයක් ක්‍රියාත්මක වූයේද? මෙහිදී දමිළ පුවත්පත්, ඉංග්‍රීසි ඇතැම් පුවත්පත් සහ සිංහල ඇතැම් පුවත්පත් මෙය වාර්තා කළ බව නැවතත් සඳහන් කළ යුතු වේ.

මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?